# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2009

මානවශාස්ත්‍ර පීඨය

සිංහල - SINH - E1015

නාට්‍ය කලාව, නූතන සිංහල කාව්‍ය හා ප්‍රබන්ධ කථා

පළමුවන ප්‍රශ්නය ද, දෙවන තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද
තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි

---

## 1 කොටස

01. පහත දැක්වෙන පද්‍යාවලිය රසාස්වාදය කරන්න.

### ගෙවල් කැඩවීමට විරුද්ධ පෙත්සම

දිළිඳු අප වසන්නා වූ ගෙවල් මේ පුරේහී
කදිම රුවට මාරුක් පත්වලින් ඇත් සොයාලා
එලෙස ඇති නමුත් නැත් සේ දයාවක් මෙතෙක් කල්
නගරික අණ මෙන් ඒවා කඩව් දැන් කියන්නා

බොහොම හොඳ ගෙවල් සාදා ඉතාමත් උසස් ලෙස්
යසට උළු හොයාලා ඉන්ට ඇත්නම් සැපෙන් දැන්
නොවෙමු අපි අසන්තොස් ඒ නමුත් ලක් නිරින්දේ
දිළිඳුකම නිසා ඒ ලෙස් කිරීමේ මගක් නෑ

ඉනට අඳින රෙද්දත් කෑම හැන්දත් අනුන්ගෙන්
පිනට හිඟ හිඟා වාගෙයි අඳින්නේ බුදින්නේ
එබඳු අපට මේ ලෙස්නෙන් අණක් ඇයි දෙවන්නේ
අප මෙපුරවරින් පන්නා දැමීමේ සිතින්දෝ

අලුයම පිබිදී ගොස් කෝපි අවුලා විඩා වී
දවසකට පනම් දුක්සේ හයක් ගන්න ගෑණු
යළි එයිනි තමන් හා දූ දරුන් එක්ව කා බී
කොහොම උලු සොයන්න දෝ ගෙවල් ඇයි උලව්වේ

දිළිඳු අපගෙ ගෑණුත් දූවරුත් පුත්තු හාමත්
වෙමින මෙපුර මාවත්හී මැරී යත් පමා නැත්
එයිනි පැමිණි හැක්වූ ඒ මහත් පව් මදක් වත්
නගරික මහතුන් වෙත්හී නොවෙත්දෝ කිකල් වත්

දැනට මෙපුර නෙක් තන්හී නිවාසී හිඟන්නෝ
අතන මෙතන ගොස් රෑ පාරවල්හී නිදත් මැයි
එලෙස අපට බෑ ඒ මන්ද කීවොත් නිරින්දේ
පුරුදු නැති නිසාමැයි කෝම දුප්පත් ව උත්තත්

එය කොහොම උවත් නැත්නම් ගෙවල් ඉන්ට සිත්සේ
කොතන හරි අපිත් ලෝකේ නිදාගන්ට ඕනෑ
එලෙස උණු කලෙක්හී රෝග පීඩා සැදීලා
මිය පරලොව යාවී මේ වදෙන් බේරිලා වත්

## 2 කොටස

02. 1970 වර්ෂයෙන් ඇරඹෙන යුගයෙහි බිහි වූ සමාජ විෂමතාව පාදක කොට ගත් පද්‍ය, රචනා, කලාත්මක නිර්මාණ වශයෙන් කොතෙක් දුරට අගය කළ හැකි ද යි නිදර්ශනාත්මකව පරීක්ෂා කරන්න.

03. පහත සඳහන් කවීන් අතරින් **එක්** අයෙකුගේ පද්‍ය රචනා පිළිබඳ අගැයීමක් කරන්න.

අ) විමලරත්න කුමාරගම
ආ) සිරි ගුණසිංහ
ඇ) දයාසේන ගුණසිංහ

04. "නාට්‍ය කලාවේ ප්‍රභවය, මානව වර්ගයාගේ විශ්වාස හා ඇදහිලි ක්‍රම සමඟ බැඳී පවතී." මෙහි සත්‍යාසත්‍යතාව විමර්ශනය කරන්න.

නැතහොත්

"නාට්‍යය යනු ඒකපුද්ගල නිර්මාණයක් නො වේ." විචාරාත්මකව සාකච්ඡා කරන්න.

05. ශ්‍රී හර්ෂදේව රජතුමා, සංස්කෘත නාට්‍ය ආකෘතිය පිළිබඳ මනා අවබෝධයකින් යුතු වූ අයෙකු යි පළ වන විචාරක මතය රත්නාවලී නාට්‍යය ආශ්‍රයෙන් විභාග කරන්න.

## 3 කොටස

06. නූතන කෙටිකථා රචකයන් සමාජ අසාධාරණය ආශ්‍රිත අත්දැකීම් ප්‍රතිනිර්මාණයෙහි දක්වා ඇති අවධානය අගය කළ හැකි ද යි නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

නැතහොත්

පහත සඳහන් කෙටිකථා අතරින් එකක් විග්‍රහ කරන්න.

අ) කෙස්වැටිය
ආ) ස්නේහය
ඇ) අකුරට යන වෙලාවේ
ඈ) කවියකුට අත්දැකීමක්

07. විරාගයෙන් ඇරඹෙන නිෂ්ක්‍රිය චරිත ඇතුළත් කෘති මාලාවෙන්, සිංහල නවකථාවේ විෂය ක්ෂේත්‍රය සීමිත භාවයට පත් වූ ආකාරය පැහැදිලි කරන්න.

08. "තෘෂ්ණාහරණ නවකථාව අතීත යුගයක් පසුබිම් කොට ගෙන රචනා වුව ද, එහි වර්තමාන සමාජ - දේශපාලන යථාර්ථය නිරූපණය වේ." මේ විචාරක මතය කොතෙක් දුරට පිළිගත හැකි ද යි විමසන්න.

***************************